රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II)

මගේ අංකය :- ආ7/4/1/22
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2005 දෙසැම්බර් 23 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධාරීන් සඳහා වූ**
**<u>නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)</u>**

2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා 2005.05.18 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 සහ 2005.07.22 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005(1) පහත සඳහන් වගන්ති සංශෝධනය කරනු ලැබේ.

**05. වාරික ගෙවීම**

I. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ සියළුම නිලධාරීන්ද, රාජ්‍ය සේවයෙන් පරිබාහිර සේවයන් සඳහා විධිමත් පරිදි තාවකාලිකව මුදාහැර ඇති නිලධාරීන්ද මෙම දායක රක්ෂණ ක්‍රමයට දායක වීම අනිවාර්යවේ. ඒ සඳහා ඔවුන්ගේ මාසික වැටුපෙන් රු. 75/- ක් බැගින් වූ වාරික මුදලක් අය කර එම වාරිකය සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත යැවිය යුතු වේ.

**06. ප්‍රතිලාභ**

උක්ත චක්‍රලේඛයේ ඇමුණුම I හි 08 වගන්තිය සහ 10 වගන්තියේ සඳහන් වෛද්‍ය රක්ෂණ ප්‍රතිලාභ පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

| | | | |
|---|---|---|---|
| 08. | රජයේ රෝහලක හෝ ආයුර්වේද රෝහලක වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයා ඇතුළු පවුල් ඒකකය වෙනුවෙන් | (සීමාව)<br>(දිනකට බැගින්) | රු. 5000/-<br>රු. 500/- |
| 10. | I සහ II යටතේ දක්වා ඇති ශල්‍ය කර්ම රජයේ හෝ පෞද්ගලික රෝහලකින් හෝ සිදු කිරීම වෙනුවෙන් අදාල ප්‍රතිලාභ ලබාදීම | | |

**07. රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම**

I. රෝහල් ගතවීමකදී හෝ හදිසි අනතුරකදී හෝ ස්වාභාවික මරණයක් සිදු වූ විටක දී හෝ දින 14 ක් ඇතුළත ඒ බැව් දෙපාර්තමේන්තු ප්‍රධානයාට දන්විය යුතුය. අදාල සියලු ම වෛද්‍ය ගාස්තු හා රෝහල් බිල්පත් ප්‍රතිලාභ ඉල්ලුම්පතට අමුණා දෙපාර්තමේන්තු ප්‍රධානයා මඟින් දින 90 ක් ඇතුළත සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

02. 2005.01.01 සිට 2005.11.30 දක්වා ඉදිරිපත්ව ඇති හිමිකම් ඉල්ලුම්පත් සඳහා ප්‍රතිලාභ ගෙවීමට ඉදිරිපත් කිරීමේදී සිදු වී ඇති ප්‍රමාදයන් නොසලකා කටයුතු කිරීමට සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පියවර ගත යුතුය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ජ/E/Establishment/unit-7/12.2005(II)